<u>කාර්ය පත්‍රිකාව</u>

**1.** පන්තිය : **8 ශ්‍රේණිය** විෂය : **විද්‍යාව** අදාල සතිය : **03 සතිය දෙසැම්බර්**

**2.** ඒකකය : 15 **ස්වාභාවික ආපදා**

### 3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:

I. විද්‍යාව පෙළ පොතේ 15 පාඩම හොඳින් කියවා තේරුම් ගන්න.

II. නාය යෑම් අවදානම ඇති දිස්ත්‍රික්ක හඳුනාගෙන ඒවා ලංකා සිතියමක ලකුණු කරන්න.

III. ඔබ ජීවත් වන්නේ රත්නපුර දිස්ත්‍රික්කයේ බෑවුම් අධික ප්‍රදේශයක යයි සිතන්න.මේ දිනවල නොකඩවා වැසි ඔබ ප්‍රදේශයට ලැබෙන අතර නාය යෑමක් ඉතා ආසන්න බව ඔබට හැඟේ. මේ පිළිබඳ ඔබ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදා කළමනාකරණ අංශ දැනුවත් කිරීම සඳහා ඔබ හඳුනාගත් සිදුවීම් ඇතුළත්කර ලිපියක් සාදන්න.

**4.** ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත් පත්, **websites, LMS** පාඩම් හා වෙනත් ඉගෙනුම් ආධාරක **(online, offline, printed)** :

I. **e -නැණපියස:**

- https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=18370
- https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=25702
- https://www.enenapiyasa.lk/lms/course/view.php?id=69

II. **E-තක්සලාව :**

- https://www.ethaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=123&lang=si

### 5. මෙම සතිය තුල නියමිත පාඩම් වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල :

I. ස්වාභාවික ආපදා වලට හේතු විස්තර කරයි.

II. ස්වාභාවික ආපදා වල විද්‍යාත්මක පදනම ආදර්ශනය කිරීම සඳහා විවිධ ආකෘති භාවිතා කරයි.

III. එක් එක් ස්වාභාවික විපත් වල හානි පිළිබඳ වෙන වෙනම අධ්‍යනය කරයි.

IV. ස්වාභාවික ආපදා වලින් සිදුවන හානි අවම කිරීමේදී සන්නිවේදනයේ වැදගත්කම අගය කරයි.

**6. ඇගයීම් / තක්සේරුකරණ ක්‍රමවේදය** :

1.ආපදාවක් කළමනාකරණය කිරීම සඳහා ප්‍රධාන පියවර මොනවාද?

2.නියං ආපදා කළමනාකරණයේදී ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයක් ලියන්න.

3. ගංවතුර ආපදා කළමනාකරණය පිලිබඳ කෙටි සටහන් ලියන්න.

4.නාය යෑමක පෙර සලකුණු මොනවාද?

5.නාය යාම් කළමනාකරණය කරන ආකාරය පැහැදිලි කරන්න.

6.අකුණු සහිත කාලගුණයක් පිලිබඳ අනාවැකි ප්‍රකාශ වූ විට අප ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද?

.